කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2021/2022
**SOC 3173 – නව සම්භාව්‍ය සමාජවිද්‍යා න්‍යාය**

කාලය : පැ දෙකයි (02)

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. සමාජ ව්‍යුහය හා ඒ තුළ හටගන්නා පුද්ගල ක්‍රියාව අතර සුවිශේෂී සබඳතාවක් හඳුනාගනිමින් ටැල්කොට් පාසන්ස් "ක්‍රියාව පිළිබඳ ස්වේච්ඡා න්‍යාය (Voluntaristic Theory of Action)" ගොඩනගන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

2. 'ඥාතිත්වය' හා 'මිත්‍යාකථා' වැනි සමාජ ප්‍රපංච ඒවා මතුවන සමාජ ව්‍යුහ පිළිබඳ සියුම් ප්‍රකාශන ලෙස ක්ලොඩ් ලෙවි-ස්ට්‍රවුස් හඳුනාගනියි. ඉහත ප්‍රකාශය විචාරාත්මකව විමසන්න.

3. මානවවංශ ක්‍රම විද්‍යාවේ අභ්‍යුපගමයන් අනුව, පුද්ගලයන් ඔවුන්ගේ එදිනෙදා ජීවිතය අර්ථ ගන්වන ආකාරය පැහැදිලි කරන්න.

4. සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදයට අනුව පුද්ගලයාගේ ස්වීයත්වය පිළිබඳ හැඟීම මතුවන්නේ අන්‍යය හා සිදුකරන අන්තර්ක්‍රියා මගිනි. සාකච්ඡා කරන්න.

5. ධනවාදී ආර්ථික ක්‍රමය පවත්වා ගෙනයාම සඳහා සංස්කෘතිය ඉටු කරන භූමිකාව අන්තෝනියෝ ග්‍රාම්ෂි ගේ 'සංස්කෘතික අධිපතිභාවය' සහ මැක්ස් හෝකයිමර් සහ තියෝඩර් ඇඩනෝර් ගේ 'සංස්කෘතික කර්මාන්තය' යන සංකල්ප ඇසුරෙන් නිදසුන් සහිතව විභාග කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම <u>දෙකක් (02)</u> පිළිබඳ කෙටි රචනා ලියන්න.

   I. ප්‍රපංචවේදය

   II. ලේබල් න්‍යාය

   III. රංගනාත්මක ප්‍රවේශය

   IV. ලුවී අල්තුසර්ගේ ව්‍යුහවාදී මාක්ස්වාදය

**************